# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : **2556629** ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/229/19 ඔබේ අංකය :

2019.11.11

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

**කෲර වධහිංසා වැළැක්වීමේ පනත යටතේ දැනට සිරගතවී සිටින පොලිස් නිලධාරීන්ට ජනාධිපති සමාවක් ලබා ගැනීම.**

ශ්‍රී ලංකා පොලිසියේ, කෲර වධහිංසා වැළැක්වීමේ පනත යටතේ වැරදිකරුවන් වී දැනට 12 දෙනෙකු පමණ සිරගතවී සිටී. මෙම නිලධාරීන් නීතිය හා සාමය සුරක්ෂා කිරීම සඳහා තම රාජකාරිය සද්භාවයෙන් ඉටුකිරීමට යාමේදී ඇතිවූ යම් ගැටළු කාරී තත්වයන් හේතුවෙන් ඉහත පනත යටතේ නඩු පැවරීමට ලක්ව බන්ධනාගාර ගතවී හෝ සිරගතවී ඇත.

මෙම නිලධාරීන් සම්බන්ධයෙන් අප සංගමය විසින් පරීක්ෂා කර බැලීමේදී, නිලධාරීන් බන්ධනාගාර ගතවීම / සිරගතවීම හේතුවෙන් නිලධාරීන්ගේ පවුල්වල ආර්ථික මට්ටම ඉතාමත් අයහපත් තත්වයට පත්ව ඇති අතර, ආර්ථික මෙන්ම සාමාජීය මට්ටමින්ද ඉතාමත් අසරණ භාවයට පත්ව ඇත.

එසේම ඉහත සඳහන් කාරණය හේතුකොට ගෙන දැනට සක්‍රියව රාජකාරියේ යෙදී සිටින නිලධාරීන් හටද යහපත් මානසික තත්වයකින් යුක්තව රාජකාරී කිරීමට නොහැකි තත්වයක් නිර්මාණය වී ඇත. මෙය නීතිය හා සාමය සුරැකීමේ ක්‍රියාවලිය වෙත ඉමහත් බලපෑමක් ඇති කරනු ලැබ ඇති බව අපගේ විශ්වාසයයි. මෙකී කාරණාවල් සමස්ථ සමාජයේ යහපැවැත්ම උදෙසා අහිතකර ලෙස බලපානු ඇත.

එබැවින් කෲර වධහිංසා වැළැක්වීමේ පනත යටතේ සිරගතව සිටින පොලිස් නිලධාරීන් හට, (ඇමුණුම 01 ලෙස යාකර ඇත.) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ඔබතුමා වෙත පැවරීඇති බලතල අනුව ජනාධිපති සමාවක් ලබාදෙන මෙන් ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින අතර, එමගින් එම නිලධාරීන්ගේ පවුල්වලට හා ශ්‍රී ලංකා පොලිසියට ද විශාල සේවයක් වන අතරම, ඉන් පොලිස් නිලධාරීන් නොබියව රාජකාරී කිරීමට පෙළඹෙනු ඇති බව අපගේ විශ්වාසයයි.

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම් / පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්,
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

අභිමානවත් පොලිසියක් ගොඩනගමු.